
# ඩී පී එඩියුකේෂන් කෝඩින් පාසල
# කෝඩින් වෙසක් කලාපය - 2023

## Animated gif ඇසුරින් ඩිජිටල් තොරණක් හදමු




DP EDUCATION Coding School


LIVEWORKSHEETS

Animated gif ඇසුරින් තොරණක් නිර්මාණය කිරීම


ඉහත පිටුවේ තිබෙන **Make my own** ක්ලික් කර AppLab වෙත පිවිසෙන්න.

සුපුරුදු පරිදි, **Remix** ක්ලික් කර **Rename** මගින් ව්‍යාපෘතියට ඔබේ නම යොදන්න.

මෙම නිර්මාණය සඳහා Screen 4 ක් අවශ්‍ය වේ. පළමු Screen එක පහත පරිදි සකස් කරගෙන ඒ තුළ buttons තුනක් නිර්මාණය කරන්න.




පළමු startScreen එකෙහි Properties







button1 හි Properties





ඉහත button1 හි Properties අනුව නිසි පරිදි සකසාගත් button1 හි පිටපත් දෙකක් **Duplicate** මගින් ලබා ගැනීමෙන් button2 හා button3 සකස්කර ගන්න.

දැන් startScreen නම් පළමු ස්ක්‍රීන් එක සකසා අවසන්ය. එයට අදාල images ඇතුළත් කිරීමට පෙර එම ස්ක්‍රීන් එක **Duplicate** මගින් පිටපත් කර තවත් ස්ක්‍රීන් 3 ක් ලබාගන්න.

LIVEWORKSHEETS

එවිට අදාල buttons තුනක් බැගින් ඇති screen1, screen2 හා screen3 පහත පරිදි ලැබේ.




දැන් එක් එක් ස්ක්‍රීන් තුළට ඇතුළත් කළ යුතු images හා animated gif තෝරාගත යුතුය. මේ සඳහා


ස්ක්‍රීන් එකක් තුළට 

අයිකනයක් ගෙනගොස් තබා ඊට අදාල රූපය තෝරා

ගැනීමට 


"Choose" මගින් 


වෙත පිවිසෙන්න. එහි ඇති රූප හඳුනා ගනිමු.





LIVEWORKSHEETS

දැන් එක් එක් ස්ක්‍රීන් තුළ images හා animated gif සුදුසු පිහිටීම් හා විශාලත්වන් ගලපමින් ඇතුළත් කළ යුතුය. ඒ සඳහා එක් එක් රූපවලට අදාල id යටතේ Properties අගයන් ලබාදෙන්න.





අවශ්‍ය පරිදි රූප මතුපිටට (ඉදිරියට) ගැනීමට හෝ පසුපසට යැවීමට පහත බොත්තම් භාවිතා කරන්න.




පහත රූපවල පරිදි එක් එක් ස්ක්‍රීන් තුළ images හා animated gif සුදුසු පිහිටීම් හා විශාලත්වන් ගලපමින් ඇතුළත් කරන්න.





startScreen




Screen1

LIVEWORKSHEETS




## දැන් කෝඩ්ස් සැකසීම සලකා බලමු

1. මුලින්ම තොරණේ පසුබිම් වාදනයක් ලෙස බොදු බැති ගීයක් ඇතුළත් කරන්න.

```
playSound("Paramitha-bala.mp3", true);
```

2. සෑම ස්ක්‍රීන් එකකම ඇති බුදුවීම button එක click කළ විට screen1 වෙත යාමට කෝඩ් සකසන්න.

```
onEvent("button2", "click", function( ) {
  setScreen("screen1");
});
```

2. සෑම ස්ක්‍රීන් එකකම ඇති ඉපදීම button එක click කළ විට screen2 වෙත යාමට කෝඩ් සකසන්න.

```
onEvent("button1", "click", function( ) {
  setScreen("screen2");
});
```


2. සෑම ස්ක්‍රීන් එකකම ඇති පිරිනිවන button එක click කළ විට screen3 වෙත යාමට කෝඩ් සකසන්න.

```
onEvent("button3", "click", function( ) {
  setScreen("screen3");
});
```

LIVEWORKSHEETS

ඔබ නිර්මාණය කළ ඇප් එකෙහි ඔබේ නම පාසල වැනි තොරතුරු ඇතුළත් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා Label tool එක භාවිතා කළ හැකිය.







**වෙනත් ජාතක කතාවකට අදාල පින්තූර සොයාගෙන ඔබට අවශ්‍ය පරිදි screen ප්‍රමාණය වැඩි කරමින් ඔබගේ ඩිජිටල් තොරණ ඇප් එක තවදුරටත් සංවර්ධනය කළ හැකිය.**

**ජාතක කතාවකට අදාල පින්තූර සොයාගැනීමට *කෘතිම බුද්ධියෙන් පින්තූර නිර්මාණය කරන AI Image Creator යෙදවුමක සහාය ලබාගත හැකි ආකාරය* ඉදිරි පාඩමකදී විස්තර කර ඇත. [ එම පාඩම බලන්න මෙහි ක්ලික් කරන්න. ]**

Microsoft Bing Image Creator සහායෙන් නලපාන ජාතකයේ පොකුණ අසල සිටින වඳුරන් සමූහයකගේ පින්තූරයක් ඉල්ලාසිටි විට අපට ලබාදුන් පින්තූර කිපය බලන්න. *මෙහිදී අපගේ අවශ්‍යතාවය තවදුරටත් පැහැදිළිව ඉදිරිපත් කළේ නම් වඩාත් යෝග්‍ය පින්තූර **AI Image Creator** මගින් ලබාදෙනු ඇත.*








LIVEWORKSHEETS